# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2016 ජූලි මස 08 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2016.07.11 දින නිකුත් කරන ලදී)**


## නැගීසිටීමට අත්වැලක් පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**නැගීසිටීමට අත්වැලක් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# නැගීසිටීමට අත්වැලක් පදනම (සංස්ථාගත කිරීමේ)

## නැගීසිටීමට අත්වැලක් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

''නැගීසිටීමට අත්වැලක් පදනම'' යන සංගමය නීත්‍යානුකූලව සංගමයක් වශයෙන් කොළඹදී පවත්වාගෙන යෑම නීත්‍යානුකූල කිරීම සඳහා කරනු ලබන කෙටුම්පතකි. එම සංගමය පිහිටුවාගෙන ඇත්තේ එකී සංගමයේ පරමාර්ථ හා අවශ්‍ය කටයුතු කරගෙන යාම සඳහා එම සංගමයේ සාමාජිකයින් විසින් ගිවිසගෙන ඇති නීති රීති අනුවය:

එකී ''නැගීසිටීමට අත්වැලක් පදනම'' පිහිටුවා ගැනීමට අදාළ වූ පරමාර්ථයන් සහ එම සංගමය පිහිටුවා ගැනීමට අදාළ වූ කටයුතු සාර්ථකව ක්‍රියාවේ යොදවා ඇති හෙයින් ද, එය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලා ඇති හෙයින් ද, මෙම ඉල්ලීම මහජන සුබසිද්ධිය පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මෙම පනත 2016 අංක     දරන නැගීසිටීමට අත්වැලක් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නැගීසිටීමට අත්වැලක් පදනම සංස්ථාගත කිරීම.

2. මෙම පනත ක්‍රියාත්මක කිරීමේ දින සිට හා ඉන් පසු (මෙහි මින්මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''නැගීසිටීමට අත්වැලක් පදනම'' දැනට සාමාජිකත්වය දරන්නන් හා එය සංස්ථාවක් ලෙස ඇතුළත් කරනු ලබන අය මින් පසු සංස්ථාවක් වශයෙන් ''නැගීසිටීමට අත්වැලක් පදනම'' යන නමින් පවත්වාගෙන යනු ලබයි. එකී සංස්ථා නාමය යටතේ සෑම උසාවියකදීම ඕනෑම නඩුවක් පැවරිය හැකි වනු අතර, පවරනු ලැබිය හැකි ය. තව ද, සංස්ථාවට පොදු මුද්‍රාවක් තබා ගැනීමේ බලය හිමි වන අතර, තම කැමැත්ත පරිදි එම පොදු මුද්‍රාව වෙනස් කිරීමට හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. එම සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ පහත සඳහන් සේ දැක්විය හැක:-

(අ) අඩු වරප්‍රසාදලාභී හා රැකියා විරහිත පුද්ගලයන් හට රැකියා ලබා ගැනීමට සහය වීම හා අවස්ථාවන් ලබා දීම තුළින් රැකියා සුරක්ෂිතභාවය ඇති කර රට තුළ ධරණීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

2—PL 010049—300 (2016/06)

(ආ) ආබාධිත සහ අනාථ, අසරණ දරුවන් ඇතුළුව අවශ්‍යතාවයෙන් පෙළෙන ළමුන් හට ආදරය, රැකවරණය, පෝෂණය සහ අධ්‍යාපනය ලබාදීමට උපකාරීවන පාසල්, ළමා නිවාස සහ වෙනත් සංවිධාන පිහිටුවීම හා පවත්වාගෙන යාම මගින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඇ) ස්වභාවික විපත්වලට ලක් වූවන්ට සහනාධාර සැපයීමට අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඈ) මානසික හා ශාරීරික සුභසාධනය උදෙසා ධනාත්මක වෙනසක් ඇතිකළ හැකි ආකාරයේ නිර්මාණාත්මක කලාවන් හැදෑරීමට තරුණ තරුණියන්හට අවස්ථා උදකරලීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඉ) අඩු වරප්‍රසාදලාභී හා අවශ්‍යතාවයන් ඇති පුද්ගලයන් හට නොමිලේ වෛද්‍ය කඳවුරු, වෛද්‍ය සායන පැවැත්වීම හා නොමිලේ බෙහෙත් ද්‍රව්‍ය, බෙදාහැරීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඊ) ජීවත්වීම සඳහා ඉඩම්, නිවාස හෝ පාසල් නොමැති ජනතාව සඳහා අවශ්‍ය ඉඩම්, නිවාස ලබාදීම හා පාසල් පහසුකම් ලබාදීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(උ) ප්‍රමාණවත් පහසුකම් නොමැති පාසල් සඳහා අවශ්‍ය ඉඩම් සහ ගොඩනැගිලි ලබාදීම හා අවශ්‍ය වෙනත් පහසුකම් ලබාදීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඌ) නැගීසිටීමට අත්වැලක් පදනමෙහි පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීමේ අදහසින් ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු සහ වෙනත් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම හා එවැනි පොත්, සඟරා පත්‍රිකා හා පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශ කිරීම සහ බෙදාහැරීම; සහ

(එ) ඉහත කී පරමාර්ථ සියල්ලම හෝ එක් පරමාර්ථයක් සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකිවන එවැනි අනෙක් සියලුම ක්‍රියාවන් සිදු කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට යටත්ව චංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීමේ සහ රඳවා ගැනීමේ බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ අවසන් කිරීමේ ද, ඇපයක් සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ එකතු කිරීමේ, මුල්‍ය ප්‍රදාන, ආධාර ලබාගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවට අයත් ඕනෑම ඉඩමක ඕනෑම ගොඩනැගිල්ලක් හෝ ආකෘතියක් ස්ථාපිත කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථය ඉටුකර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් බඳවා ගැනීමේ ද, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් අස් කිරීමේ බලපත්‍ර ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**5.** (1) සංස්ථාවේ කටයුතු මෙම පනතෙහි අනෙකුත් විධිවිධාන සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සභාපති, උපසභාපති, කළමණාකාර අධ්‍යක්ෂ, ලේකම් හා භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට යටත්ව උපරිම වශයෙන් හත්දෙනෙක් දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් තෝරා පත්කරගත් අධ්‍යක්ෂ මණ්ඩලයක් (මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම වරට අධ්‍යක්ෂ මණ්ඩලය මෙම පනත ආරම්භ වන දිනයට ආසන්න වශයෙන් පෙරාතුවම වූ දිනයේ දී ධූරය දරූ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයක් සංස්ථාවේ රීතීන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා පත් කර ගන්නා තෙක් රැඳී සිටිය යුතු ය.

**සංස්ථාවේ රීති.**

**6.** (1) මෙම පනතේ විධිවිධානවලට අනුකූල නොවන රීතියක් පහත දක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට සහ එහි කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ඕනෑම කරුණක් මහා සභා රැස්වීමක දී සහ සාමාජිකයන් 2/3 කට නොඅඩු බහුතර ඡන්දයකින් කලින් කලට සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) සාමාජිකත්වය වර්ගීකරණය සහ සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ ඔවුන්ගේ බලතල හා කාර්යයන්;

(ඇ) නිලධාරි මණ්ඩලය තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ සේවා ලබා දීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, සේවය හැරයාම හෝ සේවයෙන් ඉවත් කිරීම හා ඔවුන්ගේ බලතල සහ කාර්යභාරයන්;

(ඈ) සංස්ථාවේ සභා රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය, ගණපූරණය, එහි දී කටයුතු හැසිර විය යුතු ආකාරය; සහ

(ඉ) අරමුදල් ඇතුළුව සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය.

(2) සංස්ථාව මගින් සාදනු ලබන ඕනෑම රීතියක් වෙනස් කිරීම, අලුතින් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම, රැස්වීමක හා එවැනි උපවගන්ති (1) යටතේ සාදනු ලැබූ රීතියක් මෙන් කළ හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** (1) සංස්ථාවට තමා සතු අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්ථවරණ, පැවරීම්, පරිත්‍යාග, දයක මුදල් අන්තිම කැමති පත්‍රයෙන් බැහැර කිරීමක්, ගාස්තු, පරිත්‍යාග සඳහා වන ප්‍රදන හෝ වෙනත් ආකාරයකින් ලැබෙන දයකත්වයන් ආදී දේශීය හෝ විදේශීය පුද්ගලයින්, සාමාජිකයන් හා සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් ලැබීම යනාදී වශයෙන් මේ දක්වා හෝ මින්මතු භාරගනු ලබන සියලුම මුදල්. සංස්ථාවේ අරමුදල.

(2) ලැබෙන සියලුම මුදල් සංස්ථාවේ නමින් එක් බැංකුවක හෝ බැංකු කිහිපයක තැන්පත් කළ යුතු අතර, මණ්ඩලය තීරණය කරනු ලබන ඕනෑම සුදුසු ආකාරයකින් ආයෝජනය කළ හැකි ය.

(3) සංස්ථාවේ බලතල, කාර්යභාරය සහ ඊට අදළ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලුම වියදම් සංස්ථාවේ අරමුදල් මගින් ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.**

**8.** මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයෙහි පැවැති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතුව තිබූ සියලු ණය, දායක මුදල් හා පරිත්‍යාග මෙම පනතේ අරමුණු සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සාමාජිකයන්ගේ බැරකම් සීමා කිරීම.**

**9.** සාමාජික ගාස්තු වශයෙන් සාමාජිකයකුගෙන් අය විය යුතු මුදල් ඉක්ම වූ කිසිදු මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයන් සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු යටත් නොවන්නේ ය.

**චංචල හා නිශ්චල දේපළ වල බලය.**

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, භාරයට පත් කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් භාරයේ තබා ගැනීමට නීතියෙන් සංස්ථාවට හැකිවන අතර, මෙම පනතේ පරමාර්ථයන්ට අනුව සංස්ථාව සතු ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සහ භාරයේ පවතින අවස්ථාවක දී භාරකාර මණ්ඩලයක් මගින් සපයන ලද ආකාරයෙන් කටයුතු කිරීමටත් පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව මේ පනතින් කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාව විසින් තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව බලය පවරනු ලැබූ පුද්ගලයින් සංඛ්‍යාවක් ඉදිරි පිටදී හැර කිසිම සාධන පත්‍රයක් වෙනුවෙන් භාවිතා නොකළ යුතු යි. ඔවුන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එය සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිභාහිරව විය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.